# 12 සිත හැරී මා එනතුරා

## නැති වුණු පුත්‍රයා පිළිබඳ උපමාව



12.1 රූපය - නැති වූ පුත්‍රයා පියා විසින් සිප වැළඳ ගන්නා අවස්ථාව

ශුද්ධ බයිබලය ගෙන ලූක් 15:11-32 කියවන්න.

තම පියාගෙන් ලැබෙන ආදරයට පිටුපා සතුට හා සැපත පැතූ බාල පුතා තමාට අයිති දේපළ කොටස පියාගෙන් ඉල්ලා ගෙන ගියත්, ඒ සියල්ල ටික කලෙකින් අවසන් වෙයි. සියලු මිතුරන් ද සෙවූ සතුට හා සැපත ද අහිමි වෙයි. කෑම පවා නැති ව පාපයේ ප්‍රතිවිපාක අසීමිත ව අත්දකියි. එවිට සිහිවන්නේ තම පියාගේ ආදරය හා කරුණාවයි. පියා ළඟ සිටින සේවකයන් පවා ලබන සතුට හා සැපතයි. ඔහු සිත් හරවා ගනියි.

රජ කුමරෙකු ලෙසින් පියා අත්හැර ගිය පුතා යාචකයෙක් විලසින් නැවත පියා සොයා එයි. ඔහු සිත් හරවා ගෙන එනතෙක් බලා සිටි පියා අසීමිත කරුණාවෙන් ඔහු පිළිගනියි. සමාව දී ඔහුට හොඳ ම සළුව, මුදුව හා පාවහන් පලඳවා නැවත රජ කුමරෙක්ගේ තත්ත්වයට පත් කරයි.

දෙවියන් වහන්සේගේ ආදරය හා කරුණාව මේ උපමා කතාවට අනුව අපට පෙන්වා දෙයි. පාපි තත්ත්වය අවබෝධ කර ගෙන සිත් හරවා ගෙන ආපසු දෙවියන් වහන්සේ වෙතට එන්නාට සමාව ලබන්නට, දේව ආදරයේ සතුට හා සැපත අත් විඳින්නට මේ උපමාව ආරාධනා කරයි.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## නැති වුණු කාසිය පිළිබඳ උපමාව

රිදී කාසි දසයක් ඇති කවර ස්ත්‍රියක හෝ ඉන් එකක් නැති වුවහොත් පහනක් දල්වා ගෙය අතුගා, එය සම්බ වනතුරු අස්සක්, මුල්ලක් නෑර ඕනෑ කමින් සොයන්නේ නැද්ද? එය සම්බ වූ විට ඈ මිතුරන් ද අසල්වැසියන් ද කැඳවා, "මා සමග ප්‍රීති වන්න; මාගේ නැති වූ රිදී කාසිය සම්බ වී ය"යි ඔවුන්ට කියන්නී ය. එලෙස ම පසුතැවී සිත හරවා ගන්නා වූ එක පව්කාරයෙකු ගැන දෙවියන් වහන්සේගේ දූතයන් අතර ප්‍රීතිය ඇති වන්නේ යයි මම ඔබට කියමි.

(ලූක් 15:8-10)

රිදී කාසි දසයක් සතු ස්ත්‍රියක වුවත් ඉන් එකක් හෝ නැති වුවහොත් එය සෙවීමට ඇය දරන වෙහෙසත් සම්බ වූ විට අන් අය සමග සතුටු වන ආකාරයත් මෙම උපමාවෙන් පෙන්වා දෙයි. එලෙස දේව ආදරයේ බල මහිමය තුළ අප අත් නොහරින දෙවි පියාණෝ පාපි මාර්ගය අත හැර සිත් හරවා ගැනීමට අපට ආරාධනා කරන සේක. පසුතැවී සිත් හරවා ගන්නා අය පිළිබඳ ව දෙවියන් වහන්සේ ප්‍රීති වන ආකාරය ද අපට වටහා දෙයි. ඒ නිසා අප වෙනස් වී අන් අය ද යහපත කරා ගෙන යමු.

පාපි මගට වැටී දේව ආදරයෙන් ඈත්වී, පීඩා විඳින්නට ඉඩ නොතබා අප සොයා එන ආදරණීය පියෙකු අපට සිටින බව අපි අදහා ගනිමු.

## පව්කාර ස්ත්‍රිය



12.2 රූපය - පව්කාර ස්ත්‍රියට ජේසුස් වහන්සේගෙන් සමාව ලැබීම

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ශුද්ධ වූ ජොහන් තුමාගේ සුවිශේෂයේ 8:1-11 දක්වා හොඳින් කියවන්න. එහි සඳහන් වන්නේ පව්කාර ස්ත්‍රිය පිළිබඳ කතාවයි.

මෝසෙස් තුමාගේ නීතිය අනුව කාමමිථ්‍යාචාරය කළ අය ගල් ගසා මරන්නට නියම විය. එහෙත් ජේසුස් වහන්සේ එවැනි ස්ත්‍රියකට ද සමාව දුන් සේක. එසේ ම ජේසුස් වහන්සේ ඇයට පවසන්නේ "තවත් පව් නොකරන්න" කියා ය.

අප අතින් මෙතෙක් සිදු වූ වැරදි තේරුම් ගෙන ඒවාට මනස්ථාපනය වී නැවත නොකිරීමට ඉටා ගෙන හොඳ පාපෝච්චාරණයක් කර ජේසුස් වහන්සේගෙන් සමාව ලබා ගත යුතු ය.

## ශුද්ධ වූ අගොස්තීනු තුමා



12.3 රූපය - ශුද්ධ වූ අගොස්තීනු තුමා

ශුද්ධ වූ අගොස්තීනු තුමා ක්‍රි.ව. 354 නොවැම්බර් මස 13වන දින උතුරු අප්‍රිකාවේ තගස්තේ නුවර (අද ඇල්ජීරියාව) උපත ලැබී ය. එතුමාගේ පියා පැට්‍රිෂියස් ය. ඔහු අන්‍යාගමිකයෙකි. මව මොනිකා ය. ඇය කතෝලිකයෙකි. ඇය ශුද්ධවන්තියෙකි. ඇය ශුද්ධ මොනිකා තුමිය ලෙස හඳුන්වයි. අගොස්තීනු තුමා දක්ෂ කථිකයෙකි; කථිකාචාර්යවරයෙකි. නරක පුරුදු නිසා නොමඟ ගිය අයෙකි.

ඔහුගේ මව ස්ථිර විශ්වාසයෙන් යුතු ව දෙවියන් වහන්සේට ඔහුගේ සිත් හැරීම සඳහා යාච්ඤා කළා ය. ශුද්ධ වූ අම්බ්‍රෝස් තුමාගේ සහාය ඒ සඳහා පැතුවා ය. දිගු කලක් ඇවෑමෙන්,

* මවගේ බලවත් යාච්ඤාවෙන්
* ශුද්ධ වූ අම්බ්‍රෝස් තුමාගේ මග පෙන්වීමෙන්

ඔහු තුළ ජීවිත වෙනසක් ඇති විය. මවගේ ඉමහත් ප්‍රීතිය හා දේව ප්‍රශංසාව මධ්‍යයේ වයස අවුරුදු 33 දී පාස්කු ඉරුදින ඔහු ප්‍රසාද ස්නාපනය ලැබුවේ ය. ඒ මොහොතේ සිය මව මෙසේ පැවසුවා ය; "ආදර පුතුනි, මගේ දිවියෙහි තිබුණ එක ම පැතුම ඔබ කිතුනුවකු වනු දැකීමයි. මා පැතුවාටත් වඩා සම්දාණෝ මට දී ඇත. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා."

නපුර සැම මොහොතක ම අප වැරදි මගට යොමු කිරීමට මාන බලමින් සිටියි. අද සමාජයේ ද පාපි තත්ත්වයට ඇද දමන, දුර්පරීක්ෂා අපමණ ය. නවීන තාක්ෂණය ඔස්සේ ද එවැනි තත්ත්ව ඇත. ඒවායින් මිදී අන් අය ද මුදවා ගැනීමට කටයුතු කළ යුතු වෙමු. ඒ සඳහා ශුද්ධාත්ම වරප්‍රසාද පතා යදිමු. ශුද්ධ වූ මොනිකා තුමියගේ ආදර්ශය තුළ කටයුතු කරමු.

## ක්‍රියාකාරකම

1. "සිත හැරී මා එනතුරා ඔබ බලා සිටියා" යන ගීතිකාව ලියා ගෙන පාඩම් කරන්න. ගයන්න.
2. "පව්කරුවාට සමාව ලැබෙයි" යන්න තහවුරු කරන ශුද්ධ බයිබලයේ සඳහන් උපමා **දෙකක්** නම් කරන්න.
3. "සිත් හැරීමෙන් දේව සබඳතාව නැවත ගොඩනගා ගනිමු" මැයෙන් නිසඳැසක් ලියන්න.

### ජීවිතයට බිඳක්

කට පාඩම් කරන්න.

ජේසුස් වහන්සේ කතා කොට, "පියාණෙනී ඔවුනට කමා වුව මැනව; ඔවුන් කරන දෙය ඔව්හු නොදනි"යි වදාළ සේක.

(ලූක් 23:34)



නොමිලේ බෙදාහැරීම සඳහා ය.